**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
2018 අගෝස්තු
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) AUGUST 2018

BSCE 102: ථේරවාද බුදුදහමේ මූලධර්ම

<u>ප්‍රශ්න පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. ඊශ්වර නිර්මාණවාදය බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළේ කවර හෙයින් දැයි පැහැදිලි කරන්න.

2. අනෙකුත් භාරතීය ආගම් සැලකිල්ලට ගනිමින් බුදුසමයේ එන සුවිශේෂී ලක්‍ෂණ සාකච්ඡා කරන්න.

3. "බෞද්ධ ප්‍රතිපදාව තුළ සම්මා දිට්ඨියෙන් හා සම්මා සංකප්පයෙන් තොර සීලය අර්ථවත් නො හැකිය." සාකච්ඡා කරන්න.

4. සසර පැවැත්ම සහ නැවැත්ම පටිච්ච සමුප්පාද සිද්ධාන්තය මගින් හෙළිකෙරෙන ආකාරය සාකච්ඡා කරන්න.

5. "කර්මය හා පුනර්භවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අත්‍යන්තයෙන්ම එකට බැඳී පවතියි." විමසන්න.

6. දුක පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මිනිසා දුක් විඳීමට හුරු කරවන අශුභවාදී ඉගැන්වීමක් ද? සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. බුදුසමයෙහි ඉගැන්වෙන අනාත්ම සංකල්පයෙන් අපේක්ෂිත අරමුණු පරීක්ෂා කරන්න.

8. පඤ්චස්කන්ධ විභාගය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරන්න.

9. සමකාලීන ලෝකයේ පවත්නා සමාජ ගැටුම් සහ යුද්ධ තුරන්කර ගැනීම සඳහා ඔබ බුදුසමයේ ඉගැන්වීම් යොදාගන්නේ කෙසේද?

10. "යථාභූත ඥාන දර්ශනය පිළිබඳ සංකල්පය බුද්ධ දේශනාවේ සුවිශේෂ ඉගැන්වීමකි." විමසන්න.

==========